(6)

00279

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2019

**EPD3336/ESD1136-** මුල් ළමාවිය මධ්‍යස්ථාන සහ ප්‍රාථමික පාසල් කළමනාකරණය

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2019.03.09 | වේලාව - පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පමණක් පිළිතුරු සපයන්න.

**<u>1 වන කොටස</u>**

01. 'නායකත්ව' යන්න නිර්වචනය කරන්න.

02. කළමනාකරණ ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ප්‍රාථමික පාසලේ විදුහල්පතිවරයකු තුළ තිබිය යුතු නායකත්ව ගුණාංග පහක් (05) සඳහන් කරන්න.

04. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ක්‍රියාත්මක විය යුතු ප්‍රධාන ක්‍රියාකාරකම් පහක් (05) සඳහන් කරන්න.

05. පෙරපාසල් හෝ ප්‍රාථමික පාසල් ගුරුවරයකුට 'ස්වයං තක්සේරුව' (Self-assessment) බෙහෙවින් අත්‍යවශ්‍ය වේ. ඔබ මෙම අදහසට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරෙහි හේතු හතරක් (04) සඳහන් කරන්න.

06. පෙරපාසලක ඉගෙනුම් පරිසරය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

07. පෙරපාසලකට සති සැලැස්මක් වැදගත් වන්නේ ඇයි? ඔබේ පිළිතුරෙහි හේතු පහක් (05) සඳහන් කරන්න.

08. "මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය" කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) නායකත්ව ශෛලීන් තුනක් (03) සුදුසු උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 08)

(ii) ප්‍රාථමික පාසලක සාර්ථක නායකත්ව භූමිකාවකට දායක විය හැකි සාධක මොනවා ද? (ලකුණු 12)

10. (i) ඔබ පෙරපාසලක මිනිස් සම්පත් සහ භෞතික සම්පත් ලබා ගැනීම සහ කළමනාකරණය කරන්නේ කෙසේ ද යන්න උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ප්‍රාථමික පාසල් ගුණාත්මකව පවත්වාගෙන යාමට දෙමාපිය දැනුවත් කිරීමේ වැඩ සටහන් වැදගත් වන්නේ කෙසේද යන්න උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 10)

11. (i) සදාචාරාත්මක සංවර්ධනය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 10)

(ii) සිසුන්ගේ සදාචාරාත්මක සංවර්ධනය හා සම්බන්ධ ප්‍රාථමික ශ්‍රේණි ගුරුවරයකුගේ වගකීම් විග්‍රහ කරන්න. (ලකුණු 10)

12. (i) ප්‍රාථමික පාසල් සිසුන් සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් පහක් (05) ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

(ii) ඔබ ඉහත සඳහන් කළ එක් ක්‍රියාකාරකමක් (01) තෝරාගෙන ප්‍රාථමික සිසුන් සඳහා එය සංවිධානය කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ප්‍රාථමික සිසුන් සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ වාසි පහක් (05) ලියන්න. (ලකුණු 08)

13. (i) පෙරපාසලක දෛනික ක්‍රියාකාරකම් සැලසුම් කිරීමෙහි ලා සලකා බලන සාධක මොනවා ද? (ලකුණු 10)

(ii) පෙරපාසලක දෛනික ක්‍රියාකාරකම් සඳහා යොදා ගත යුතු ඉගෙනුම් - ඉගැන්වීම් ද්‍රව්‍ය පහක (05) ස්වභාවය විස්තර කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.